www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

09 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | ඒකකය 06 - මගේ රට මට අගෙයි / රචනාවක් ලියමු

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. ඇසෙයි අලුයම් දුරේ
තේවාවෙ හේවිසිය
පිරෙයි සිත බුදු බැතින්
පහන් වෙයි සිත් සතන්...
ලියදි වට කෙත් යාය
දිසෙයි අරුණලු රඟන
ගලා යයි දිය කඳුරු
නිල් නිල්ව ගිරි සිරස...

ඉහත පද්‍ය කොටස කියවන විට ඔබගේ සිතේ ඇතිවන අදහස අලංකාරවත් වාක්‍ය දහයත් පහළවත් අතර වන ඡේදයක් සේ ගොනු කරන්න.

02. පහත දී ඇති කොටස්වලට ගැළපෙන මාතෘකා යොදා ගනිමින් වචන 200 ක පමණ රචනා ලියන්න.

I. වර්තමානයේ ලෙඩ රෝග බොහොමයකට හේතුව නියමිත සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය නොකිරීමයි. සෑම කාලයකටම එකම අයුරින් සෞඛ්‍ය ආරක්ෂිත පුරුදු අනුගමනය කරන්නේ නම් බොහෝ ලෙඩ රෝගවලින් ආරක්ෂා විය හැකි බව වෛද්‍යවරුන්ගේ මතයයි. ඒ අනුව ''සෞඛ්‍ය පුරුදු පිළිපදිමු ලෙඩ රෝග වලින් වැළකෙමු'' යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.

II. නූතනයේ ඇති අති දවැන්ත තාක්ෂණික මෙවලම් හමුවේ මිනිසාට කළ නොහැක්කක් නොමැති තරම්ය. එහෙත් මේවායෙහි ඇලී ගැලී සිටීම කොතරම් දුරට මිනිසාට හිතකර ද යන්න ගැටළුවක්ව පවතී. ''නූතන තාක්ෂණික මෙවලම් සහ මිනිසා'' යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.

III. විවිධාකාරයේ බහුවිධ රෝගාබාධ වලින් වැළකීමේ බලයක් දේශීය ආහාර සහ පරිභෝජන රටාව තුළ ඇති බැව් වර්තමානය වන විට ලෝකයා පිළිගෙන ඇති සත්‍යකි. එසේ නම් ''දේශීය ආහාර පරිභෝජන රටාවේ වැදගත්කම'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

*සැකසුම: එස්.ඒ. ප්‍රියංගනී මිය*

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk